සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2020 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,198 - 2020 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා - 2020.10.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1784 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 නොවැම්බර් මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ඔක්තෝබර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1783 - B 82070— 5,403 (2020/10)
F 1 -

# පළාත් සභා නිවේදන

## කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ගොවිජන පන්තියට අයත් නොවන තැනැත්තන් වන රණවිරුවන් තෝරාගැනීම සඳහා වූ ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනයයි

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරාගැනීමට කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2021.01.15 දින පෙ.ව. 9.00ට කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ රණවිරුවන් සඳහා ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* දිස්ත්‍රික්කය : කුරුණෑගල

*(ආ)* උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : කොටවෙහෙර

*(ඇ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය හෝ කොට්ඨාස : 253 කොටවෙහෙර

*(ඈ)* ඉඩමේ පිහිටි ගම : ඉහළ කැලේගම

*(ඉ)* ඉඩමේ නම : කෝන්ගහ මූකලාන

*(ඊ)* ඉඩමේ පිහිටීම : කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ

*(උ)* අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : නේවාසික කටයුතු සඳහා

*(ඌ)* අන්සතු කරනු ලබන ඒකකය : පර්චස් 15

2. රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා ඉඩම් නොමැති පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලනු ලැබේ. ඉල්ලුම්කරුගේ ආදායම සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2020.12.12 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොටවෙහෙර යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතුය.

4. ඉල්ලුම්කරු ඉඩම ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2021.01.15 දින පෙ.ව. 9.00 ට කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට හෝ ඇයට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම ඉල්ලුම්කරුවෙකුම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ *නැතහොත්* තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා වුව ද එම ඉඩම වෙනුවෙන් නියම කරනු ලැබූ මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුනු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මිලට හිලව් කරනු ලැබේ.

7. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් ඔවුන් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවලදී ලබා ගත හැක.

i. පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ), පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල
ii. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොටවෙහෙර

එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර,
ඉඩම් කොමසාරිස් (වයඹ).

2020 සැප්තැම්බර් මස 25 වැනි දින දී ය.

ඉල්ලුම්පත්‍රයේ සහ දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘතිය පහතින් දක්වා ඇත.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ රණවිරුවන්ගේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට ඉඩම් කච්චේරි අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :............................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................................

3. (i) ලිපිනය :.....................................................................................................................................................................

(ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :..................................................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :.............................................................................................................................

4. ගෘහ මූලික අංකය :.........................................................................................................................................

5. ස්ත්‍රී/පුරුෂ භාවය :.........................................................................................................................................

6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :......................................................................................................

7. උපන් දිනය :.....................................................................................................................

8. විවාහක/අවිවාහක බව :......................................................................................................................

9. රැකියාව :............................................................................................................................

10. රැකියාව කරන ස්ථානය :...................................................................................................

11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර.-

| *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |

(නිවාස හා දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :.......................................................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :- (තමාගේ ද?/බද්දට ද?/අනවසරයෙන් ද? යන වග) :.............................................

15. නිවස පිහිටි ස්ථානය :.......................................................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :.......................................................................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| *නම* | *වයස* | *ඉගෙනුම ලබන පාසලේ නම* | *ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය* |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද ? එසේ නම් පහත විස්තර සපයන්න.

ලබාගත් ණය මුදල :.......................................................................................................................................
ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :.......................................................................................................
දැනට ගෙවීමට ඇති ශේෂය :.......................................................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද ? තිබේ නම් පහත විස්තර සපයන්න.

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල* |
|---|---|---|
| (1) | | |
| (2) | | |
| (3) | | |

20. ඉඩම් ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟවන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. ඉදිරිපත් කරන තොරතුරු, තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළිවුවහොත් මාගේ තෝරාගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................................

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

..............................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :.................................................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.........................................

අනු අත්සන් කරමි.

................................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**දිවුරුම් ප්‍රකාශය**

............................................................ දිස්ත්‍රික්කයේ ................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .................................... ................................... ග්‍රාම නිලධාරි වසමේ ...................................................................................................... පදිංචි ......................................... ................................................................................ වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්කර ..................... රූඩ් ................... පර්. ..................... ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිලදී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

| |
|---|
| රු. 50 මුද්දරය<br>මත අත්සන්<br>කරන්න. |

..........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

...................................................,
සාමදාන විනිශ්චයකාරතැන.

10-634

---

**උතුරු මැද පළාත් සභාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව තුළ පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2019.07.25 දින පැවති මහ සභාවේ යෝජනාවෙන් සම්මත කර ඇති තීරණය, උතුරු මැද පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මම, 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තියේ සඳහන් විධි විධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මහීපාල හේරත්,
උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරවර.

2020 ජූලි මස 07 වැනි දින දී ය.

10-635

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.